ත්‍රිපෝෂ
THRIPOSHA
திரிபோஷ
A SRI LANKA FORTIFIED FOOD PROGRAMME OF THE MINISTRY OF HEALTH

**Sri Lanka Thriposha Limited**
**PB 3873**
**A FULLY GOVERNMENT OWNED COMPANY**
**P.O. Box 17, Kapuwatta, Ja-Ela, Sri Lanka.**
**Tel: +94 112236588/ 2237418/ 2233451| Fax: +94 11 2237363**
**E-mail: thriposha@gmail.com, slthriposha.distribution@gmail.com**

මගේ අංකය: SLTL/MKT/2023/13

දිනය: 2023.10.11

## මාධ්‍ය නිවේදනයයි!

මෙම දින වල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් හි ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන සම්බන්ධයෙන් සමාජගත කරනු ලබන ව්‍යාජ තොරතුරු සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම.
අදාල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් අදාල නඩුව ගොනු කර ඇත්තේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් **2022.10.12** දිනැතිව නිකුත්කළ අංක R.No 3675 (MFD/2889/2022) නිකුත්කළ වාර්තාව මත පදනම් ව **2022 වර්ෂයේ** නිෂ්පාදනයකට වන අතර මෙම නිෂ්පාදන සියල්ල වෙළඳපොල මගින් ඉවත්කර ගැනීමක් ද අදාල වකවානුව තුල සිදුකර ඇත. Aflatoxin යනු නිෂ්පාදකයින් විසින් භාහිරින් එක්කරනු ලබන දෙයක් නොව බඩඉරිඟු වැනි කෘෂිකාර්මික භෝගවල දක්නට ලැබෙන දිලීර ප්‍රභේදයකින් නිපදවන රසායනික ද්‍රව්‍යකි. මෙය සුපෝෂ වල පමණක් නොව එම කාලවකවානුවේ බඩඉරිඟු ආශ්‍රිතව නිපදවන ලද සියලුම පෝෂ කාණ්ඩයේ නිෂ්පාදනයන්හි අන්තර්ගත වීම හේතුවෙන් උද්ද්ගත වූ ගැටළුවකි.
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් 2022.10.12 දිනැතිව නිකුත්කළ අංක R.No 3675 (MFD/2889/2022) දරණ රසපරීක්ෂක වාර්තාව අනුව එහි අන්තර්ගත Aflatoxin ප්‍රමාණය 5.5ppb (Total (B1+B2+G1+G2)) ප්‍රමාණයකි .

1980 අංක 26 දරණ ආහාර පනතට අනුව අහාර කාණ්ඩයෙහි අඩංගු විය හැකි Aflatoxin ප්‍රමාණය වැඩිහිටියන් සඳහා 30ppb වලට වඩා අඩු විය යුතු අතර වසර 03 අඩු දරුවන් සඳහා මෙම ප්‍රමාණය 1 ppb වලට වඩා අඩු විය යුතු වේ.

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් මෙම නඩුව ගොනු කිරීම සඳහා නඩු නිමිත්ත වන්නේ ඇසුරුමෙහි "වයස අවුරුදු 03 වැඩි ළමුන් සහ වැඩිහිටියන් සඳහා" යන්න අන්තර්ගත නොවීම පමණි එබැවින් එලෙස ඇසුරුමෙහි අන්තර්ගත නොකර විකිණීම සම්බන්ධයෙන් අදාල වෙළඳ සැලට මෙන්ම එලෙස ඇසුරුමෙහි සටහන් නොවීම යන වරද සම්බන්ධයෙන් නිෂ්පාදකයා ලෙස වරද පිළිගෙන ගරු අධිකරණය නියමකළ දඩ මුදල ගෙවීමක් සිදුකරන ලදී. එමෙන්ම එම වරද අදාල වකවානුවේ සිටම නිවැරදි කිරීම සඳහා අවශ්‍ය සියලුම ආකාරයේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව "වයස අවුරුදු 03 වැඩි ළමුන් සහ වැඩිහිටියන් සඳහා" ලෙස ඇසුරුමෙහි මුද්‍රණය කිරීමට ද කටයුතු කරන ලදී.

පෝෂ කාණ්ඩයේ Aflatoxin සම්බන්ධව අධිකරණයකදී වරද පිළිගෙන දඩ ගෙවීමක් සිදුකල ලංකාවේ එකම ආයතනයත් අප ආයතනය නොවන අතර අනෙකුත් පෝෂ කාණ්ඩයේ පෞද්ගලික ආයතන වරද පිළිගෙන දඩ ගෙවීම් සම්බන්ධයෙන් කිසිදු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යක ප්‍රචාරය නොකර මුනිවත රකින සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යට අවධාරණය කරනුයේ රජයට සම්බන්ධ රාජ්‍ය ආයතනයක් වීම මතම අප ආයතනය සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයකින් හෝ සොයා බැලීමකින් තොරව අඛණ්ඩව පුවත් මවමින් අප ආයතනයට පමණක් අගතියක් වන අයුරින් පුවත් සමාජගත කිරීම සම්බන්ධයෙන් අපගේ බලවත් කණගාටුව හා අප්‍රසාදය පළකර සිටිමු.

අප ආයතනයේ නිෂ්පාදනයන්හි පමණක් පැකට්ටුවෙහි මුහුණතේ වයස අවුරුදු 03 වැඩි ළමුන් සහ වැඩිහිටියන් ලෙස මුද්‍රණය කලද අනෙකුත් කිසිදු ආයතනයක් එලෙස මුහුණතෙහි මුද්‍රණය කර නොමැති බවත් ය.

මේ පිලිබඳව තවදුරටත් සොයාබැලීම පිණිස අවශ්‍යනම් අප ආයතනය මගින් ද විමසන ලෙසත් තවදුරටත් සොයාබැලීමෙන් අනතුරුව මෙම පුවත නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසත් මෙලෙසම එයද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන් මගින් සමාජගත කිරීමට කටයුතු කරන ලෙස ද ඉල්ලා සිටිමු.

දීප්ති කුලරත්න

සභාපති

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්